# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,334 - 2023 මැයි මස 26 වැනි සිකුරාදා - 2023.05.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1062 |


සැ. යු. - (i) බැංකු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2023 මැයි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ජූනි මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූනි මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1059 - B 82457 — 5,403 (2023/05)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

**2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම**

2021 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස. (උසස් පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම් කරන පිළිවෙල :**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා apply.sliate.ac.lk වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගත ව අයදුම් කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ.

Z ලකුණු මත සහ SLIATE විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ විභාගයක ලකුණු මත පදනම්ව HND පාඨමාලා සඳහා තෝරා ගැනීමේ කාණ්ඩ දෙකක් ඇත.

| | |
|---|---|
| **කාණ්ඩ - 1** Z ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HNDA, HNDBA, HNDBF, HNDE (Civil), HNDE (Mechanical), HNDE (Electrical & Electronics), HNDQS, HNDBSE, HNDT (Agriculture), HNDFT |
| **කාණ්ඩ - 2** තෝරාගැනීමේ විභාගයේ ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා | HND in English, HNDIT, HNDM, HNDPM, HNDTHM |

HND පාඨමාලා සඳහා වන ප්‍රවේශ සුදුසුකම් 'A' **කොටසේ** සහ උසස් තාක්‍ෂණ ආයතන (ATIs) පිළිබඳ විස්තර 'B' **කොටසේ** බලන්න.

එක් කාණ්ඩයක් රු. 500.00 බැගින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ට කාණ්ඩ දෙකෙන් ම අධ්‍යයන පාඨමාලා සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු කාණ්ඩ දෙකට ම ඉල්ලුම් කරන්නේ නම් රු. 500.00 බැගින්, වෙන වෙනම සෘජුව ම බැංකුවට ගෙවිය යුතු වේ. මාර්ගගත ගෙවීම් සඳහා අවසර නැත.

බැංකු ලදුපතෙ හි සඳහන් මුදල් හුවමාරු අංකය (TRN අංකය) මාර්ගගත අයදුම්පතෙ හි සඳහන් කළ යුතුවේ.

**2023 ජූනි මස 26** වැනි දින හෝ ඊට පෙර මහජන බැංකුව, හයිඩ්පාර්ක් ශාඛාව, කොළඹ - 02 හි, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනීය ගිණුම් අංක **025-2-001-1-3397613** දරන ගිණුම වෙත ගෙවීම් කළ යුතුය. එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ **මහජන බැංකු ඕනෑම ශාඛාවක්** මගින් ගෙවීම් සිදුකළ හැකිය.

මාර්ගගත අයදුම්පත්‍රය තහවුරු කිරීමෙන් පසු, අයදුම්පත්‍රයේ පද්ධතිය මගින් උත්පාදිත මුද්‍රිත පිටපතක් ලබා ගන්න. අදාළ උසස් තාක්ෂණ ආයතනයෙ හි තෝරාගත් පාඨමාලාව සඳහා ලියාපදිංචි වන විට, ඉහත අත්සන් කළ අයදුම්පත සහ ගෙවීම් ලදුපත ඉදිරිපත් කළ යුතුය.

**දෙවන කාණ්ඩය යටතේ පාඨමාලා සඳහා ඉල්ලුම් කර ඇති සිසුන් විභාගයට/විභාග සඳහා පෙනී සිටින විට ඉහත අත්සන් කරන ලද අයදුම්පත, විභාග ප්‍රවේශ පත්‍රය සහ ගෙවීම් ලදුපත අදාළ උසස් තාක්ෂණ ආයතනය වෙත රැගෙන ආ යුතුය. (විභාග මධ්‍යස්ථානය)**

දෙවන කාණ්ඩය යටතේ පාඨමාලාවක් සඳහා අයදුම්කර ඇති සිසුන්, පහත විභාග මධ්‍යස්ථානවලින් විභාග මධ්‍යස්ථානය තෝරාගත යුතු ය. අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, දෙහිවල, ගාල්ල, ගම්පහ, යාපනය, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මන්නාරම, රත්නපුර, තංගල්ල, ත්‍රිකුණාමලය, වවුනියාව.

මෙම ක්‍රියාවලිය තුල දී සහ ඉන් පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි ලබා දී ඇති විද්‍යුත් තැපැල් මගින් හෝ ජංගම දුරකථන ඔස්සේ හෝ තැපැල් මගින් දන්වනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන **2023 ජූනි මස 26** වැනි දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

***පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය :***

**පූර්ණ කාලීන පාඨමාලා**
**අර්ධ කාලීන පාඨමාලා (සති අන්ත)**
**ඉගැන්වීමේ මාධ්‍යය - ඉංග්‍රීසි**

අර්ධ කාලීන පාඨමාලා අදළ ක්ෂේත්‍රයන් හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පවත්වනු ලැබේ.

*පාඨමාලා ගාස්තු :*

**පූර්ණ කාලීන (Full-Time)** පාඨමාලා ගාස්තු - නොමිලේ

එක් අධ්‍යයන වාරයක් (සමාසිකයක්) වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ :-

- උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (**HNDA**) - රු. 17,000.00
- ඉංග්‍රීසි පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (**HND in English**) - රු. 17,000.00
- උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (HNDIT) - රු. 30,000.00
- අර්ධකාලීන පාඨමාලා සඳහා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතු ගාස්තුව - රු. 10,000.00

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේ දී අවශ්‍ය අධ්‍යාපනික සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලිවල මුල් පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.

**නේවාසිකාගාර පහසුකම් :**

පූර්ණ කාලීන සිසුන් සීමිත සංඛ්‍යාවකට පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනයන් හි ඉල්ලීම මත පමණක් නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

දෙහිවල සහ ගම්පහ උසස් තාක්ෂණ ආයතන - සිසුවියන් සඳහා පමණක්
අම්පාර සහ කොළඹ උසස් තාක්ෂණ ආයතන - සිසුන් සහ සිසුවියන් සඳහා

**"A" කොටස**

*උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවන් සඳහා ප්‍රවේශ සුදුසුකම් :*

01. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA)**

**01.1 පූර්ණ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය ද සහිතව අ. පො. ස. (උ/පෙළ) විභාගය එකවර සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**01.2 අර්ධ කාලීන - වසර 4ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) අ. පො. ස. (උ/පෙළ) වාණිජ විෂය ධාරාවෙන් ගිණුම්කරණය එක් විෂයයක් ලෙස එකවර සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

**සහ**

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**හෝ**

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගය එකවර සමත්වීම.

**සහ**

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඕනෑම සහතිකපත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

A. ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව
B. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය
C. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය
D. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය

**සහ**

අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම,

**සහ**

අයදුම්කරු අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයකුව) නිරත ව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

*සටහන 1 :*

පහත සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් ඇති වාණිජ විෂය ධාරාවේ ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා අර්ධකාලීන අයදුම්කරුවෙකු අනෙකුත් ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන්නේ නම් උසස් තාක්ෂණ ආයතනවල ධාරිතාව තිබේ නම්, සහ පළමු වසරෙන් නිදහස් කර දෙවන වසරට බඳවා ගනු ලැබේ.

(i) SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

(ii) කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් තිබීම.

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II (හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර් මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I සහ II) සම්පූර්ණ කිරීම.

(iv) වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA -UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(v) සහතික ලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCA-UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

(vi) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

(vii) සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA - Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත්ව තිබීම.

*සටහන 2* : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාර ව බඳවා ගැනීමේ පටිපාටියන්හි දී උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි, පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.

**02. උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමා පාඨමාලාව (HNDBA) පූර්ණ කාලීන - වසර 2 ½ ක්**

**03. උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (HNDBF ) පූර්ණ කාලීන - වසර 2 ½ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) වාණිජ විෂයය ධාරාව යටතේ එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**04. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (සිවිල්) HNDE (Civil) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**05. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (විදුලි සහ විද්‍යුත්) HNDE (Electrical and Electronics) - පූර්ණ කාලීන - වසර 3 ½ ක්**

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව (යාන්ත්‍රික) HNDE (Mechanical) - පූර්ණ කාලීන වසර 3 ½ක්**

**07. උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව HNDQS - පූර්ණ කාලීන - වසර 2 ½ක්**

**08. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා පාඨමාලාව HNDBSE -පූර්ණ කාලීන - වසර 3½ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) භෞතික විද්‍යා විෂය ධාරාවෙන් (රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය) එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**9. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)**

9.1 **පූර්ණ කාලීන- වසර 2 ½යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.) ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ;

**හෝ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

9.2 **අර්ධ කාලීන - කාලය වසර 2 ½ක්**

9.1 හි සුදුසුකම්වලට අමතරව අයදුම්කරු රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායකයක/පිළිගත් ආයතනයක (සේවක අර්ථසාධක/සේවක භාරකාර අරමුදල් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කළ යුතුය) හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDFT) පූර්ණ කාලීන වසර 2 ½යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i) ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

11. **උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDIT)**

11.1 **පූර්ණ කාලීන - වසර 2 ½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

11.2 **අර්ධ කාලීන - වසර 2 ½යි.**

11.1 හි සඳහන් සුදුසුකම්වලට අමතරව අයදුම්කරු රජයේ ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් ආයතනයක (සේවක අර්ථසාධක / සේවක භාරකාර අරමුදල් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කළ යුතුය.) හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

12. **උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව** (HNDM)
**පූර්ණකාලීන - වසර 3 ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**හෝ**

(ii) කාර්මික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය (රාජ්‍ය පරිපාලන/අලෙවිකරණය) ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

13. **උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDPM)**
**පූර්ණ කාලීන - වසර 2 ½ යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය ;

(i) ඕනෑම විෂය ධාරාවකින් එකවරක දී අ.පො.ස. උ/පෙළ විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන් ලබා තිබීම.

14. **උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්මය) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT- Agriculture)**
**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ජීව විද්‍යාව විෂය ධාරාවෙන් එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම. (ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව සමඟ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය ඇතුලත්ව) ;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

15. **උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)**
**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම;

**සහ**

අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**"B" කොටස**

උසස් තාක්ෂණ ආයතනවල **(ATIs)** නම්, ලිපිනයන්, දුරකථන අංක සහ උසස් ජාතික ඩිප්ලෝමා **(HND)** පාඨමාලා
**[පූර්ණ කාලීන (FT) සහ අර්ධ කාලීන (PT)]**

| | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය - අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර | 063-2222056<br>063-2223035 | HNDT (Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT), HNDA (PT), HND in English (PT) HNDIT(PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය - අනුරාධපුරය | අක්කර 111, අනුලා මාවත, පණ්ඩුලගම, අනුරාධපුරය | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT), HNDIT(PT) HNDA (PT), HND in English (PT) |
| 03 | උසස් තාක්ෂණ ආයතනය - බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT (PT), HNDA (PT),HND in English (PT) |
| 04 | උසස් තාක්ෂණ ආයතනය - මඩකලපුව | කෙලින් වීදිය, කෝවිල් කුලම් නැගෙනහිර, ආරයම්පති, මඩකලපුව | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය - කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15 | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT) , HNDE Mechanical) (FT), HNDE (Electrical & Electronics) (FT), HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය - දෙහිවල | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDBF(FT), HNDTHM(FT), HNDA (PT), HND in English (PT) |
| 07 | උසස් තාක්ෂණ ආයතනය - ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT), HNDE(Mechanical) (FT), HNDE(Electrical & Electronics) (FT) HNDQS(FT), HNDIT (FT), HNDT(Agriculture) (FT) HNDA (FT), HNDM(FT), HNDTHM(FT), HNDBA(FT), HND in English (FT), HNDA (PT), HNDIT (PT), HND in English (PT) |
| 08 | උසස් තාක්ෂණ ආයතනය - ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | HNDT (Agri) (FT), HNDIT (FT), HNDFT(FT), HNDA (FT), HNDA (PT),), HNDIT (PT), |

| | *උසස් තාක්ෂණ ආයතනයේ නම* | *ලිපිනය* | *දුරකථන අංක* | *පවත්වනු ලබන පාඨමාලා* |
|---|---|---|---|---|
| 09 | උසස් තාක්ෂණ ආයතනය - යාපනය | අංක 665/2, වෙරළ පාර, ගුරුනගර්, යාපනය | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE (Electrical & Electronics)(FT), HNDA (FT), HND in English(FT), HNDQS(FT), HNDM(FT), HNDIT (FT), HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 10 | උසස් තාක්ෂණ ආයතනය - මහනුවර | අංක 16, කැප්පෙටිපොල මාවත, මහනුවර | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT), HNDA (PT),HND in English (PT), HNDIT (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය - කෑගල්ල | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English (FT), HNDPM(FT), HNDA (PT), HND in English (PT) |
| 12 | උසස් තාක්ෂණ ආයතනය - කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583<br>037-2224911 | HNDIT(FT), HNDA(FT), HNDM(FT) HND in English (FT), HNDTHM(FT) HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 13 | උසස් තාක්ෂණ ආයතනය - මන්නාරම | ද ලාසාල් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් ගොඩනැගිල්ල, තලෙයිමන්නාරම පාර, මන්නාරම | 023-3122555 | HND in English (FT), HNDIT (FT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය -නාවලපිටිය | අංක 154/6, ගම්පොල පාර, (බ්ලැක් ස්ට්‍රීට්) ආයිශ්වර්යා ශාලාව, 4 වන මහල, නාවලපිටිය | 054-2050634 | HNDTHM(FT), HNDM(FT), HND in English (PT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය - රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492<br>045-2231493 | HNDIT (FT), HNDA (FT), HNDA (PT), HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය - සමන්තුරය | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරය | 067-2261304 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDM (FT) HNDIT (PT) HNDA (PT), HND in English (PT) |
| 17 | උසස් තාක්ෂණ ආයතනය - තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 047 2241845<br>047 2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT) |
| 18 | උසස් තාක්ෂණ ආයතනය - ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝතය නගර්, ත්‍රිකුණාමලය | 026 2223232 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය - වවුනියාව | ඒ 9 පාර, වෙප්පන්කුලම්, ඕමාන්තෙයි, වවුනියාව | 024 2052733 | HNDA (FT), HND in English (FT) HNDA (PT), HND in English (PT) |

*සටහන :*

01. අයදුම්කරු අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.
02. උසස් ජාතික ඩිප්ලෝමා පූර්ණ කාලීන පාඨමාලා සඳහා අ.පො.ස (උ/පෙළ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට තිබිය යුතු අවම ලකුණු ප්‍රමාණය 25 කි. අයදුම්කරු උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා තිබිය යුතුය.
03. උසස් ජාතික ඩිප්ලෝමා සඳහා 02 කාණ්ඩයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින් බඳවා ගැනීම මධ්‍යස්ථාන 16ක දී පවත්වනු ලබන ඊට අදළ ලිඛිත පරීක්ෂණ ලකුණු මත පදනම් වේ. පහත දක්වෙන පරිදි ලිඛිත පරීක්ෂණ දෙකක් දින දෙකක දී පවත්වනු ලැබේ.
    (i) HND in English ඉංග්‍රීසි සඳහා තේරීම් පරීක්ෂණය
    (ii) HNDIT, HNDM, HNDPM සහ HNDTHM සඳහා පොදු තේරීම් පරීක්ෂණය
04. වයස අවුරුදු 23ට අඩු, පූර්ණ කාලීන සිසුන් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.
05. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා එම අධ්‍යයන පාඨමාලාවලට අවම වශයෙන් සිසුන් 50ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන්, එම පාඨමාලාව ම පවත්වනු ලබන ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය, අවසාන තීරණය වේ.
06. සියලුම පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල දේශන සඳහා සහභාගී විය යුතු ය.
07. අර්ධ කාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.
08. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ දේශන ශාලාගතව (පන්ති මට්ටමින්) වේ.
09. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා HNDA (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහා වන දේශන සති අන්තයේ දී පැවැත්වේ.
10. HNDM පාඨමාලාවල පළමු හා දෙවන වසර සඳහා වන දේශන සතියේ දිනවල දී පැවැත්වේ. මෙම අධ්‍යයන පාඨමාලාවේ තුන්වැනි වසරේ දේශන සති අන්තයේ පවත්වනු ලැබේ.
11. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06ක කාලයක් අදළ ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුව ලබාගත යුතුය.
12. අර්ධ කාලීන අයදුම්කරුවන් අදළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.
13. **යම් ශිෂ්‍යයකු පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරා ගැනීමෙන් පසුව වෙනත් කිසිදු උසස් තාක්ෂණ ආයතනයක් සඳහා කිසිදු හේතුවක් මත ස්ථාන මාරුවීම් සිදුකරනු නොලැබේ.**
14. ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට කිසිදු ගාස්තුවකින් තොරව අදාල ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට දින 60කට පෙර ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අවසර දෙනු ලැබේ.
15. (i) දින 60 කට පසු ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් රැඳී සිටින කාලය සඳහා මසකට රු. 5,000.00 ක් අය කෙරේ. උපරිමය රු. 30,000.00 ක් මාස හයක් හෝ ඊට වැඩි කාලයක් තුල ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් අය කෙරේ.
    (ii) අර්ධ කාලීන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ දී, රුපියල් 10,000.00 ක් ආපසු ගෙවිය හැකි මූලික මුදල් තැන්පතුව ලෙස අයකරනු ලබන අතර, එය පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලැබේ. ශිෂ්‍යයා පාඨමාලාව අවසන් කිරීමට පෙර පාඨමාලාව හැර ගියහොත්, මෙම තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. ලියාපදිංචියේ දී සම්පූර්ණ ගාස්තුව එකවර ගෙවන අර්ධ කාලීන අයදුම්කරුවන්ට 10% ක වට්ටමක් ලබා දෙනු ඇත.
16. සතියේ දිනවල සහ සති අන්ත දිනවල පූර්ණ කාලීන සහ අර්ධ කාලීන සිසුන් සඳහා සමාසික අවසාන වාර විභාග පවත්වනු ලැබේ.
17. අ.පො.ස. (උ/පෙළ) සහ අ.පො.ස. (සා/පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.
18. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්කරුවෙක් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
19. 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාක්ෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනීය අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.
21. වැඩිදුර තොරතුරු සඳහා www.sliate.ac.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2023.06.26** දින වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

05-315

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 5) හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ විවෘත තරග විභාගය -2023

## Open competitive Examination for the enrollment of students for the National Diploma in Agricultural Production Technology (NVQ 5) in Sri Lanka Schools of Agriculture - 2023

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන්හි පැවැත්වෙන "කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව" හැදෑරීම සඳහා 2022/ 2023 ශිෂ්‍ය කණ්ඩායමට අදාළව 2024 වර්ෂයට සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් 2023 දෙසැම්බර් මාසය තුළ දී සිංහල හා දෙමළ මාධ්‍යවලින් ප්‍රධාන නගර කීහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වීමට අපේක්ෂිත ය.

02. කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටම (NVQ 5) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අනුරාධපුර, බිබිල, ලබුදුව, පාලමුණේ, පරන්තන් හා වාරියපොල යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශවයට ම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 1½ කි. එයින් වසරක කාලයක් කෘෂිකර්ම විද්‍යාලයක් තුළ දී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබාගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුළත්කර ගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම්වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරීක්ෂා කරනු ලැබේ.

2.6 පාඨමාලාව සඳහා අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පාඨමාලාවක් හදාරා ලබා ගත් සුදුසුකම් මත ඉල්ලුම් කල හැකිය.

03. පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :

3.1 අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත අයදුම්කරන අයදුම්කරුවන් සඳහා

3.1.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතුය.

**සහ**

අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

**හෝ**

අ.පො.ස.(උ.පෙළ) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාව තුළ ජෛව පද්ධති තාක්ෂණවේදය/ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් හදාරා අවම වශයෙන් එක් විෂයයක්වත් සමත් වී තිබීම.

*වැදගත්:-* **ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදාළ විෂයයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදාරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.**

3.1.2 වයස :

2023.06.26 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 1998.06.26 දින හෝ ඊට පසු හා 2005.06.26 දින හෝ ඊට පෙර විය යුතුය.)

3.2. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා

3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සහිතව විෂයයන් 06කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබිය යුතු අතර භාෂාව සහ තවත් ඕනෑම විෂයයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ හෝ ඊට ඉහල සාමාර්ථ ලබා තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළදී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ.

**සහ**

කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ පහත සඳහන් කුමන හෝ පාඨමාලාවක් හදාරා තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම මගින් ලබා දෙන ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) සහතික ලාභියෙකු වීම.

- පැල තවාන් සංවර්ධන සහායක
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- උද්‍යාන අලංකරණ ශිල්පී
- භූ දර්ශන සංවර්ධන සහායක

**හෝ**

කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ වෙනත් පාඨමාලාවක්

3.2.2 වයස :

2023.06.26 දිනට මෙම අයදුම්කරුගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 1988.06.26 දින හෝ ඊට පසු හා 2005.06.26 දින හෝ ඊට පෙර විය යුතුය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතු වලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලාව හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල්වන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරාගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය.)

3.4 පූජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන :

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය **සිංහල හා දෙමළ මාධ්‍යය** වලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිත ව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී 2023 දෙසැම්බර් මාසය තුළ දී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදාළ අංකය අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇතුළත් කළ යුතුය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | අම්පාර |
| 2. | අනුරාධපුරය |
| 3. | දඹුල්ල |
| 4. | ගම්පහ |
| 5. | ගාල්ල |
| 6. | හම්බන්තොට |
| 7. | මහනුවර |
| 8. | කුරුණෑගල |
| 9. | වව්නියාව |

4.3 විභාග මධ්‍යස්ථාන සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැතිවිට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

5. පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම :

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කල යුතුය.

5.2 විභාග ගාස්තුව **රු.1300.00කි.** මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැර කර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත් කල දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ නියමිත ස්ථානයේ සඳහන් කල යුතුය.

5.3 අයදුම් පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතුවේ. අයදුම්පත සම්බන්ධයෙන් යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 0812 388 340 හෝ 0812 388 341 යන දුරකථන අංක වලින් විමසීමක් කල හැකිය.

5.4 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් ද සිදු නොකෙරේ.

5.5 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2023.06.26** දිනෙන් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.6 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කල අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීම අනිවාර්යය වේ.

5.7 එසේ ලබාගත් මුද්‍රිත පිටපත පහත සඳහන් සියලු ඇමුණුම් සහිත ව නොගැලවෙන පරිදි අමුණා ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2023.07.05** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 5)" යන්න සඳහන් කළ යුතුය.

ඇමුණුම් :

අ. අ.පො.ස (උසස් පෙළ) සුදුසුකම් මත අයදුම් කරන අයදුම්කරුවන් සඳහා

i. අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
iv. ජාතික හැඳුනුම්පතෙ හි ඡායා පිටපතක්
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

ආ. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ Level 4) පාඨමාලාවක් හදාරා සහතිකපතක් හිමි අයදුම්කරුවන් සඳහා

i. අ.පො.ස. (සා.පෙ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්
ii. ජාතික වෘත්තීය සුදුසුකම් 4 මට්ටමේ (NVQ 4) සහතිකය
iii. උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
iv. ජාතික හැඳුනුම්පතෙ හි ඡායා පිටපතක්
v. මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත

නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැති වන හෝ අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.8 5.7 හි සඳහන් සියලු ඇමුණුම් සහිත අයදුම්පතෙ හි මුද්‍රිත පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. අනන්‍යතාවය සනාථ කිරීම :

6.1 විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුලදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථකල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත්කල යුතුවේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලංකා රියැදුරු බලපත්‍රය

07. විභාග ක්‍රමය :

7.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහා ම ලකුණු 100 බැගින් ලබා දී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණුවල සාමාන්‍ය වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

7.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30%ක් වේ.

7.3 විෂය නිර්දේශය :

කෘෂිකර්මය : අ.පො.ස. (සා.පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන

විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

බුද්ධි පරීක්ෂණය : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක්වේ. බහුවරණ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු වේ.

7.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඊට අදාළ ලදුපත ඇතුළුව 5.7 හි සඳහන් අනෙකුත් ඇමුණුම් සහිත ව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මගින් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම් දෙනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදාළ තොරතුරු සමගින් 081 2388085 හෝ 081 2388059 යන දුරකථන අංකවලින් විමසීමක් කල හැක.

7.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ගවන විද්‍යුත් තැපැල් ලිපිනය, Whatsapp අංකය හා දුරකථන අංක බඳවා ගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වා ගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

7.6 විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, මාණ්ඩලික සේවයේ නිලධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරියලත් නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය.

7.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය.

7.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

7.9 තරග විභාගයේ දී සිසුන් ලබාගත් ලකුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැලකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහි දී අධ්‍යාපනික හා අදාළ අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන් පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

7.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකට ම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිඳු දීමනාවක් ගෙවනු නොලැබේ.

08. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

8.1 පාඨමාලාව සඳහා බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 90% ක ප්‍රමාණයක් අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් මත බඳවා ගැනීමට කටයුතු කරන අතර, ඉතිරි 10% ක ප්‍රමාණය ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ Level 4) මට්ටමේ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.

8.2 අදාළ වර්ෂයේ දී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කර ගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම් පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

8.3 යම් අයදුම්කරුවෙක් ම පාඨමාලාවට බඳවා ගැනීම සඳහා කරනු ලබන අනියම්/අයුතු බලපෑම් ඔහු/ඇය පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා නුසුදුස්සක් වීමට හේතුවේ.

8.4 පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කෘෂිකර්ම විද්‍යාලයන්ට අනුයුක්ත

කිරීමෙන් පසු ඔවුන්ට කෘෂිකර්ම විද්‍යාල අතර මාරු වීම් සිදු කළ නොහැක.

8.5 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාවට ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව හැර යන්නේ නම් නැවත පාඨමාලාව හැදෑරීම සඳහා කිසිදු අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

8.6 බඳවා ගැනීමට අදාළ කරුණු සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

8.7 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පලවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක්, අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

පී. මාලති,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2023 මැයි මස 18 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

05-334

---

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

**රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න**

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2023 වර්ෂය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 22,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 31,000

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,000

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**
**පොත් බැඳීම - Book Binding - NVQ 4**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 26,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන්ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එක සේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.19,000

**ඕෆ්සෙට් පත් ලිතෝකරණය - Sheetfed Offset Printing**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂෙත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂෙත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 26,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම 2018 වර්ෂයේ නිෂ්පාදිත Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවකි.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 21,000

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Design for Print**

මුද්‍රණ රටා නිර්මාණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටලු මෙන්ම රටා නිර්මාණකරණ සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 50,000

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද, මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත. මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැළි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් සරලව අන්තර්ගතය සකස් කර ඇත.

කාලය : වසර 1යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 40,750

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකථන : 011 2686162, 011 2679791, 071 9716655,
ෆැක්ස් : 011 2686162
ඊ-මේල් : sliopdir@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.
දුරකථන අංක : 066 2222172, 071 0554298.

05-000

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.